**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය - 2021**

----------------------------------------------------------------------

පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යාන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5792-එල්කේ දරන ණය ගිවිසුමේ 2(ආ)(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

----------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථානයන්හි සංරක්ෂණ අරමුණු හා ප්‍රජාවේ ප්‍රතිලාභ සඳහා පරිසර පද්ධති කළමනාකරණ තත්ත්ව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. නියමු භූ දර්ශන සැලසුම් කිරීම හා කළමනාකරණය, ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම හා අලි-මිනිස් සහජීවනය, රක්ෂිත ප්‍රදේශ කළමානරකණය සහ ආයතනික ධාරිතා හා ව්‍යාපෘති කළමනාකරණය යන ප්‍රධාන සංරචක 04 ක් යටතේ මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 10,007.39 කට සමාන ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 45 ක් වූ අතර, මුළු මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් මූල්‍යයනය කිරීමට එකඟත්වය පළ කර ඇත. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2021 ජූනි 30 දින වන විට එය නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2022 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කර බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| **අංකය** | **ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය** | **මුදල (රු.) මිලියන** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තෙමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන කොන්ත්‍රාත් 11 ට අදාළ රඳවුම් මුදල රු.මිලියන 16.2 ක් වුවද රු.මිලියන 18.6 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් රඳවුම් මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල අධිතක්සේරු වී තිබුණි. | 2.4 | වැඩිපුර ගිණුමගත කරන ලද රඳවුම් මුදල නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | රඳවුම් මුදල් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් පදවිය රක්ෂිතය වටා මායිම් කණු 2800 ක් සෑදීමට ගොවි සංවිධාන වෙත ගෙවන ලද ශ්‍රමික ගාස්තු ස්ථාවර වත්කම් වශයෙන් හඳුනාගෙන නොතිබුණි. | 5.9 | වටිනාකම රු.මිලියන 5.9, අදාළ ගිණුම්වලට මාරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හුරුළු පාරිසරික උද්‍යානයේ වැසිකිළි පද්ධතිය ප්‍රතිස්ථාපනය සඳහා දරනු ලැබූ වියදම ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 3.2 | වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හුරුළු පාරිසරික උද්‍යානයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් දරන ලද රු.මිලියන 3.2 ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | -එම- |
| (ඈ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් හා අනෙකුත් ක්‍රියාකාරකම් වෙනුවෙන් පිළිවෙලින් දරන ලද රු.මිලියන 6 ක් හා රු.මිලියන 3.5 ක වියදම් 2021 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 9.5 | මෙවැනි අතහැරීම් ඉදිරියේදී සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. | ගෙවිය යුතු වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුමගත කළ යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියල කර නොතිබුණි. | අවශ්‍ය සංශෝධනයන් සහිතව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර අනුමත කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජූලි 16 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 08/2018 හි 07(ඇ) ඡේදය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වාහන දෙකක් භාවිතා කර තිබුණි. | වර්තමානයේදී මෙම වාහනය ව්‍යාපෘතියේ සියලු නිලධාරීන් විසින් අවශ්‍යතාවය පරිදි භාවිතා කරයි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 15 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2019 හි 09 ඡේදය සහ ව්‍යාපෘති මෙහෙයුම් සංග්‍රහයේ 2.1.1 ඡේදය. | චක්‍රලේඛය පරිදි ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව පිහිටුවා තිබූ නමුත් භාණ්ඩාගාර නියෝජිතයෙකු පත් කර නොතිබුණි. එම කමිටුව කාර්තුවකට එක් වරක්වත් රැස්විය යුතු නමුත් 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය තෙක් එලෙස කටයුතු කර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂවලදී ලේකම් තනතුර වෙනස් වීම, සහ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් ව්‍යාපෘති කමිටු රැස්වීම පැවැත්වීමට අපහසු වීම. | චක්‍රලේඛය හා ව්‍යාපෘති මෙහෙයුම් සංග්‍රහය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති මෙහෙයුම් සංග්‍රහයේ 4.2.5 ඡේදය | වාර්ෂිකව ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදුකළ යුතු වුවද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එපරිදි කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු විසින් වත්කම් සමීක්ෂණය සිදු කරනු ලබයි. | ව්‍යාපෘති මෙහෙයුම් සංග්‍රහය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශත | | |
| 3(සී) | නුවරඑළිය වන විද්‍යාතනයේ කණිෂ්ඨ කාර්ය මණ්ඩල නිල නිවාසය හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිල නිවාසය ඉදි කිරීම.(පළමු කොටස) | 100 | 56.1 | නියමිත කාලය තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම හා ප්‍රමාදය පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පවතින ව්‍යුහයේ ගැටලු, අවසන් පරිශීලකයාගේ නිශ්කාශන කටයුතු ප්‍රමාද වීම, සැළසුමේ හා උපදෙස් දීමේ ගැටලු සහ ඉන්ධන සහ අමුද්‍රව්‍ය හිඟකම. |
| 3(සී) | නුවරඑළිය වන විද්‍යාතනයේ ගොඩනැගිලි අලුත් වැඩියාව හා යටිතල පහසුකම් සංවර්ධනය. (දෙවන කොටස) | 100 | 50.3 | -එම- | අපද්‍රව්‍ය පවිත්‍රාගාරය අවසන් කිරීමේ අඩුපාඩු, ව්‍යුහයේ අඩුපාඩු, ඉන්ධන හා ද්‍රව්‍ය හිඟය. |
| 3(සී) | නුවරඑළිය වන විද්‍යාතනයේ ආපනශාලාව ඉදිකිරීම, සහ වැඩපළ අලුත්වැඩියාව. (තුන්වන කොටස) | 100 | 40.62 | -එම- | උපදෙස් දීම ප්‍රමාද වීම, නානකාමර සැලසුම් වෙනස් වීම සහ ඉන්ධන හා අමුද්‍රව්‍ය හිඟය. |
| 3(සී) | නුවරඑළිය වන විද්‍යාතනයේ ව්‍යායාම් ශාලාව අලුත්වැඩියාව අධ්‍යක්ෂකගේ නිල නිවාස, විශ්‍රාම ශාලාව සහ ගරාජය ඉදිකිරීම. (හතරවන කොටස) | 100 | 86.95 | -එම- | වෙනත් කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ බිම් හරහා ජලනල එලීමේදී ඇති වූ බාධාවන් සහ ඉන්ධන හා අමු ද්‍රව්‍ය හිඟය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3(ඪ) | නුවරඑළිය වන විද්‍යාතනයේ නව පරිපාලන කාර්යමණ්ඩල නවාතැන (කොටස් 03 ක්), ක්‍රීඩාපිටිය සහ මාර්ග පද්ධතිය ඉදිකිරීම. (පස්වන කොටස) | 94.5 | 34.2 | -එම- | අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම් සඳහා ගස් ඉවත් කිරීමේ ප්‍රමාදය, මායිම් ඉදිකිරීමේ හා හඳුනාගැනීමේ උපදෙස් දීම ප්‍රමාදවීම සහ ඉන්ධන හා අමුද්‍රව්‍ය හිඟය. |
| 3(ඪ) | නුවරඑළිය වන විද්‍යාතනයේ නව පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩල නවාතැන සහ ශ්‍රවණාගාර ගොඩනැගිල්ල අලුත්වැඩියාව. (හයවන කොටස) | 33.05 | 18.1 | -එම- | අවසාන පරිශීලකයාගේ නිෂ්කාශන කටයුතු ප්‍රමාදවීම සහ ඉන්ධන, අමුද්‍රව්‍ය හිඟය. |
| 3(ඪ) | ගිරිතලේ පිහිටි ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පවතින පරිපාලන ගොඩනැගිල්ල අලුත්වැඩියාව. (පළමු කොටස) | 100 | 30.5 | -එම- | කොන්ත්‍රාත්කරු මූල්‍ය ගැටලුවලට මුහුණදීම. |
| 3(ඪ) | ගිරිතලේ පිහිටි ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පැරණි නේවාසිකාගාරය අලුත්වැඩියාව. (දෙවන කොටස) | 100 | 19 | -එම- | කොන්ත්‍රාත්කරු මූල්‍ය ගැටලුවලට මුහුණදීම. |
| 3(ඪ) | ගිරිතලේ පිහිටි ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීම. (තුන්වන කොටස) | 100 | 39 | -එම- | කොන්ත්‍රාත්කරු මූල්‍ය ගැටලුවලට මුහුණදීම. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය** නුවරඑළිය වන විද්‍යාතනයේ කාර්යයන් 2022 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට බලාපොරොත්තු වන බව සහ ගිරිතලේ පුහුණු මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත්තුව නවතා දැමීමට බලාපොරොත්තු වන බව හා නැවත ටෙන්ඩර් කැඳවීමට කටයුතු කරන බව.

**විගණකගේ නිර්දේශය** ව්‍යාපෘති අරමුණු ලබා කර ගැනීමට කටයුතු කළ යුතු බව.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| මීටර් 11,123 ක් සඳහා හයිඩ්‍රොලික් පීඩන පරීක්ෂා කිරීමකින් තොරව වටිනාකම රු.මිලියන 17 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | පීඩන පරීක්ෂාවකින් පසුව ගෙවීම් කරනු ලැබේ. | විදේශාධාර ව්‍යාපෘතිවලින් ලැබෙන ණය ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |